NALANDA VIDYALAYA COLOMBO 10

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

NALANDA VIDYALAYA COLOMBO 10

**ඒකක පරීක්ෂණය**

| 11 ශ්‍රේණිය | ඉතිහාසය | 6 ඒකකය |
|---|---|---|

## ශ්‍රී ලංකාවට නිදහස ලැබීම

- ❖ **පාඩම් ඒකක ප්‍රශ්න මාලාව**
- ❖ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

### I කොටස

- **පහත සඳහන් ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. ශ්‍රී ලංකාවට නිදහස ලබාදීම පිළිබඳ සෝල්බරි ආණ්ඩුක්‍රමය පිළිබඳ රාජාඥාව බ්‍රිතාන්‍යයන් විසින් නිකුත් කරනු ලැබුවේ කවරදාද?
    (1). 1944 දෙසැම්බර් මාසයේදී
    (2). 1945 සැප්තැම්බර් මාසයේදී
    (3). 1946 මැයි මාසයේදී
    (4). 1947 ජුනි මාසයේදී

02. සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පැවැත්වූ ප්‍රථම පාර්ලිමේන්තු මැතිවරණයට ඉදිරිපත් නොවූ දේශපාලන පක්ෂයක් වන්නේ,
    (1). ලංකා ඉන්දියානු සංගමය
    (2). ලංකා සමසමාජ පක්ෂය
    (3). කම්කරු පක්ෂය
    (4). ශ්‍රී ලංකා නිදහස් පක්ෂය

03. සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ රජයේ කටයුතු ගෙනයාම සඳහා ස්ථාපිත නොවූ අංශය කුමක්දැයි තෝරන්න.
    (1). ආණ්ඩුකාර ධූරය
    (2). කැබිනට් මණ්ඩලය
    (3). පාර්ලිමේන්තුව
    (4). අධිකරණය

04. සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ අගමැතිවරයා යටතේ පවත්වාගෙන යා යුතු අමාත්‍යාංශයක් වූයේ කවරෙක්ද?
    (1). ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශය
    (2). මුදල් හා ආරක්ෂක අමාත්‍යාංශය
    (3). අභ්‍යන්තර හා විදේශ කටයුතු අමාත්‍යාංශය
    (4). ආරක්ෂක හා අධිකරණ අමාත්‍යාංශය

05. සෝල්බරි ව්‍යවස්ථාව යටතේ අධිකරණයේ කටයුතු සඳහා විනිසුරුවන්ගේ කටයුතු සිදුකරනු ලැබුවේ කවුරුන්ද?
    (1). සෙනෙට් සභාව මගින්
    (2). අධිකරණ ඇමතිවරයා මගින්
    (3). අධිකරණ සේවා කොමිසම මගින්
    (4). ශ්‍රේෂ්ඨාධිකරණය මගින්

06. ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ඉතිහාසය තුළ පැරණිතම දේශපාලන පක්ෂය කුමක්ද?
    (1). ලංකා කොමියුනිස්ට් පක්ෂය
    (2). ලංකා සමසමාජ පක්ෂය
    (3). බොල්ෂෙවික් ලෙනින් පක්ෂය
    (4). එක්සත් ජාතික පක්ෂය

07. පහතින් දක්වා ඇත්තේ ලංකාවේ දේශපාලන පක්ෂ වන අතර එම පක්ෂවල නායකයන් ඉදිරියෙන් දක්වා ඇත. එසේ නොගැළපෙන නායකයන් සම්බන්ධ වූ පිළිතුර තෝරන්න.

(1). කම්කරු පක්ෂය - ඒ.ඊ. ගුණසිංහ මහතා

(2). ද්‍රවිඩ සංගමය - ජී.ජී. පොන්නම්බලම් මහතා

(3). ෆෙඩරල් පක්ෂය - සිවනේෂන් චන්ද්‍රකාන්ත මහතා

(4). කොමියුනිට්ස් පක්ෂය - එස්.ඒ. වික්‍රමසිංහ මහතා

08. මහජන එක්සත් පෙරමුණ නිර්මාණය කිරීමේදී එයට සම්බන්ධ නොවූ දේශපාලන පක්ෂයක් නොවූයේ කුමක්ද?

(1). ශ්‍රී ලංකා නිදහස් පක්ෂය

(2). විප්ලවකාරී සමසමාජ පක්ෂය

(3). භාෂා පෙරමුණ

(4). කොමියුනිට්ස් පක්ෂය

09. පහතින් ඇති පිළිතුරුවල දක්වා ඇත්තේ එක් එක් වර්ෂයන්වල ලංකාවේ පැවැත්වූ මැතිවරණයන්, එම මැතිවරණවලින් ජය ලැබූ පක්ෂයන් හා එම පක්ෂයෙන් අගමැතිවරයා වශයෙන් තේරී පත්වූ පුද්ගලයන්ය. එසේ නිවැරදිව සඳහන් නොවන පිළිතුර තෝරා ඉරක් ගසන්න.

(1). 1947 - එක්සත් ජාතික පක්ෂය - ඩී.එස්. සේනානායක මහතා

(2). 1952 - එක්සත් ජාතික පක්ෂය - සර් ජෝන් කොතලාවල මහතා

(3). 1956 - මහජන එක්සත් පෙරමුණ - එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා

(4). 1972 - සමගි පෙරමුණ - සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය

10. පළමු ජනරජ ව්‍යවස්ථාව අනුව පළමුවරට ස්ථාපිත කළ ආයතනයක් වූයේ කුමක්ද?

(1). ජනාධිපති තනතුර

(2). කැබිනට් මණ්ඩලය

(3). පාර්ලිමේන්තුව

(4). අධිකරණය

11. පළමු ජනරජ ව්‍යවස්ථාවට අනුව අධිකරණ පද්ධතිය තුළ ඉහළම අධිකරණය වූයේ කුමක්ද?

(1). ශ්‍රේෂ්ඨාධිකරණය

(2). මහාධිකරණය

(3). දිසා අධිකරණය

(4). මහේස්ත්‍රාත් අධිකරණය

12. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයා සම්බන්ධයෙන් නිවැරදි නොවන පිළිතුර තෝරන්න.

(1). රජයේ ප්‍රධානියා වේ

(2). විධායකයේ ප්‍රධානියා වේ

(3). අධිකරණ පද්ධතියේ නායකයා වේ

(4). සන්නද්ධ සේවාවන්හි සේනාධිනායකයා වේ

13. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරයාට හිමිවන සුවිශේෂ වරප්‍රසාදයක් ලෙස සඳහන් කළ හැක්කේ,

(1). ජාත්‍යන්තර වශයෙන් ජනරජය නියෝජනය කිරීම

(2). ජනාධිපතිවරයාට කිසිදු උසාවියක නඩු පැවරිය නොහැකි වීම

(3). රාජ්‍ය උත්සවවල මුලසුන දැරීම

(4). කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා වීම

14. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හඳුන්වාදුන් නවාංගයක් ලෙස සැලකිය හැක්කේ කුමක්ද?
   (1). ද්වීමණ්ඩල පාර්ලිමේන්තුව
   (2). ශ්‍රේෂ්ඨාධිකරණය
   (3). සමානුපාතික නියෝජන ක්‍රමය
   (4). කේවල නියෝජන ක්‍රමය

15. වික්ටෝරියා ජලාශය ඉදිකිරීම සඳහා ආධාර හා තාක්‍ෂණික දැනුම ලබාදුන් රට කුමක්ද?
   (1). ස්වීඩනය
   (2). බ්‍රිතාන්‍යය
   (3). බටහිර ජර්මනිය
   (4). මහජන චීනය

16. වී වගාවේ දියුණුව සඳහා නිදහසෙන් පසු රජයක් විසින් ගනු ලැබූ පියවරක් නොවන්නේ,
   (1). රාජ්‍ය වැවිලි සංස්ථාව පිහිටුවීම
   (2). වී සඳහා සහතික මිල ක්‍රමයක් හඳුන්වාදීම
   (3). වී පර්යේෂණ ආයතනයක් හා අභිජනන මධ්‍යස්ථානයක් පිහිටුවීම
   (4). රාජ්‍ය බැංකු මගින් ගොවියන්ට ණය ලබාදීමට කටයුතු කිරීම

17. නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය හඳුන්වාදෙමින් දුප්පත් දරුවන්ට නොමිලේ අධ්‍යාපනය ලබාදීමට කටයුතු කළ අධ්‍යාපන ඇමතිතුමා කවුරුන්ද?
   (1). සුරනිමල රාජපක්ෂ මහතා
   (2). රණසිංහ ප්‍රේමදාස මහතා
   (3). සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මහතා
   (4). ඊරියගොල්ල මහතා

18. කෘෂිකර්ම ඇමතිවරයා ලෙස ගොවිජනපද ව්‍යාපාර අරඹමින් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ නව විප්ලවයක් කළ පුද්ගලයා කවුරුන්ද?
   (1). ඩඩ්ලි සේනානායක මහතා
   (2). එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා
   (3). හෙක්ටර් කොබ්බෑකඩුව මහතා
   (4). ඩී.එස්. සේනානායක මහතා

19. පහතින් දක්වා ඇත්තේ නිදහසෙන් පසු ජනාධිපති ධූරයට පත්වූ පුද්ගලයන්ය. එම පිළිතුරු බලා නොගැළපෙන පිළිතුර තෝරන්න.
   (1). ජේ.ආර්. ජයවර්ධන, ආර්. ප්‍රේමදාස, ඩී.බී. විජේතුංග, චන්ද්‍රිකා බණ්ඩාරනායක
   (2). ජේ.ආර්. ජයවර්ධන, ආර්. ප්‍රේමදාස, මහින්ද රාජපක්ෂ, මෛත්‍රීපාල සිරිසේන
   (3). ආර්. ප්‍රේමදාස, ඩී.බී. විජේතුංග, මහින්ද රාජපක්ෂ, ගෝඨාභය රාජපක්ෂ
   (4). චන්ද්‍රිකා බණ්ඩාරනායක, රනිල් වික්‍රමසිංහ, මහින්ද රාජපක්ෂ, මෛත්‍රීපාල සිරිසේන

20. කඩිනම් මහවැලි සංවර්ධන ව්‍යාපාර ආරම්භ කිරීමට කටයුතු කළ රාජ්‍ය නායකයා කවුරුන්ද?
   (1). සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය
   (2). ජේ.ආර්. ජයවර්ධන මහතා
   (3). මහින්ද රාජපක්ෂ මහතා
   (4). මෛත්‍රීපාල සිරිසේන මහතා

## II කොටස

01. සපයා ඇති ලංකා සිතියමේ පහත සඳහන් ස්ථාන ලකුණු කරන්න.

(ඉරණමඩු වැව, පදවිය වැව, වික්ටෝරියා ජලාශය, කොත්මලේ ජලාශය, මහවැලි ගඟ, ඇළහැර ඇල, රිදියගම, දේවහුව, නුවර වැව, හුරුලු වැව)



02. පහත සඳහන් රූපසටහන් ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ).



(i). මෙම රූප සටහනනේ සිටින පුද්ගලයා කවුරුන්ද?

..........................................................................................

(ii). ඔහු දැරූ තනතුර කුමක්ද? ..............................................

(iii). මොහු එම තනතුර හෙබවූයේ කුමන කාලයකදීද?

..........................................................................................

(iv). මොහු විසින් දැරූ ඉහත තනතුර ස්ථාපිත කරන ලද්දේ කුමන ආණ්ඩුක්‍රමයක් යටතේද? ..............................................

(ආ).



(i). මෙම රූප සටහනනේ දැක්වෙන පුද්ගලයා කවුරුන්ද?

..........................................................................................

(ii). ඔහු විසින් දැරූ තනතුර කුමක්ද?

..........................................................................................

(iii). ඔහු කුමන දේශපාලන පක්ෂයක් නියෝජනය කළේද?

..........................................................................................

(iv). ඔහු විසින් හඳුන්වාදුන්නේ කුමන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක්ද?

..........................................................................................

(ඇ).



(i). මෙම රූපයේ දැක්වෙන ගොඩනැගිල්ල කුමක්ද?

..........................................................................................

(ii). මෙය පිහිටා තිබෙන්නේ කුමන ප්‍රදේශයකද?

..........................................................................................

(iii). මෙම ගොඩනැගිල්ලට සම්බන්ධ ආයතනයේ ප්‍රධානියා කවුරුන්ද? ..............................................

03. පහතින් අසා ඇති කෙටි ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ලංකාවේ ප්‍රථම පාර්ලිමේන්තු මැතිවරණයෙන් ජයගත් දේශපාලන පක්ෂය කුමක්ද?

..........................................................................................

(ii) නිදහස් ලංකාවේ ප්‍රථම අගමැතිවරයා ලෙස පත්වූයේ කවුරුන්ද?

..........................................................................................

(iii) සෝල්බරි ප්‍රතිසංස්කරණ යටතේ එංගලන්ත කිරීටය නියෝජනය කිරීම සඳහා ස්ථාපිත කළ තනතුර කුමක්ද?

..........................................................................................

(iv) සොල්බරි ප්‍රතිසංස්කරණ යටතේ පාර්ලිමේන්තුවේ ප්‍රධාන මන්ත්‍රී මණ්ඩල දෙක කුමක්ද?

..........................................................................................

(v) සොල්බරි ආණ්ඩුක්‍රමය යටතේ එංගලන්ත පාර්ලිමේන්තු සම්ප්‍රදායට අනුව කැබිනට් මණ්ඩලය පාර්ලිමේන්තුවට .............................................. වගකීමට බැඳී සිටී.

(vi) 1956 මැතිවරණයෙන් ........................................................................ පක්ෂය බලයට පත්වූ අතර එහි නායක ........................................................................ මහතා අගමැතිවරයා ලෙස පත්විය.

(vii) සිංහල රාජ්‍ය භාෂාව බවට පත්කිරීමට කටයුතු කරනු ලැබුවේ .......................................... පෙරමුණ විසින් පිහිටවූ ආණ්ඩුව මගිනි.

(viii) 1956 මැතිවරණයේදී ........................................................................ යන පංච මහා බලවේගවල සහාය මහජන එක්සත් පෙරමුණට හිමිවිය.

(ix) 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සම්මත වන පනත් කෙටුම්පත්වල නීත්‍යානුකූලභාවය පරීක්ෂා කිරීමට ........................................................................ අධිකරණය පිහිටුවීය.

(x) ජේ.ආර්. ජයවර්ධන මහතා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පූර්ණ .................................... ධූරය ස්ථාපිත කළහ.

(xi) ජනමත විචාරණය ........................................................ ව්‍යවස්ථාව තුළින් හඳුන්වා දෙන ලදී.

(xii) පාර්ලිමේන්තුව සඳහා නියෝජිතයින් තෝරා ගැනීමට ............................................. නියෝජන ක්‍රමය 1978 දී හඳුන්වා දී ඇත.

(xiii) කඩිනම් මහවැලි සංවර්ධන ව්‍යාපාරය යටතේ මහවැලි සංවර්ධන ඇමතිවරයා වූයේ කවුරුන්ද?

........................................................................................................................................

(xiv) කඩිනම් මහවැලි සංවර්ධන ව්‍යාපාරය යටතේ අවශ්‍ය වැඩකටයුතු කිරීම සඳහා 1978 දී ........................................................................ පිහිටුවනු ලැබූහ.

(xv) රන්දෙණිගල වේල්ල ඇතුළු ජල යෝජනා ක්‍රමයට ආධාර කරනු ලැබුවේ කුමන රටක්ද?

........................................................................................................................................

(xvi) කොත්මලේ ජලාශය ඉදිකිරීම සඳහා ආධාර සපයනු ලැබූ රට කුමක්ද?

........................................................................................................................................

(xvii) ලංකාවේ වී පර්යේෂණ ආයතනය පිහිටුවා තිබෙන්නේ කුමන ප්‍රදේශයේද?

........................................................................................................................................

(xviii) ලංකාවේ ප්‍රථම කාර්මික ජනපදය පිහිටවූයේ කුමන ප්‍රදේශයේද?

........................................................................................................................................

(xix) ලංකා විශ්වවිද්‍යාලය පිහිටවූයේ කුමන වර්ෂයේද? කුමන ප්‍රදේශයේද?

........................................................................................................................................

(xx) මෙරට තුළ ආරම්භ කරන ලද පළමුවන බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමය කුමක්ද?

........................................................................................................................................

- **පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

04. (i). ඩී.එස්. සේනානායක මහතා 1947 දී බ්‍රිතාන්‍යයන් සමඟ අත්සන් කළ ගිවිසුම් දෙකක් ලියන්න. (ල.03)

(ii). 1947 පාර්ලිමේන්තු මැතිවරණය සඳහා ඉදිරිපත්වූ දේශපාලන පක්ෂ හතරක් ලියන්න. (ල.04)

(iii). සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ ස්ථාපිත වූ පාර්ලිමේන්තුව පිළිබඳ හඳුන්වාදෙන්න. (ල.05)

(iv). ලංකාවේ ක්‍රියාත්මක දේශපාලන පක්ෂ ක්‍රමය පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ල.06)

05. (i). 1972 අණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පිහිටවූ අධිකරණ පද්ධතිය තුළ ස්ථාපිත කෙරූ අධිකරණ තුනක් ලියන්න. (ල.03)

(ii). එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතාගේ අගමැති ධූර කාලය තුළ හඳුන්වාදුන් ප්‍රතිපත්ති ලියා දක්වන්න. (ල.04)

(iii). 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ස්ථාපිත වී තිබූ මූලිකාංග දෙකක් පිළිබඳ විස්තර කරන්න. (ල.05)

(iv). 1972 ව්‍යවස්ථාවට අනුව ජනාධිපති තනතුර පිළිබඳ හඳුන්වාදෙන්න. (ල.06)

06. (i). 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තුව සතු ප්‍රධාන බලතල තුනක් ලියන්න. (ල.03)

(ii). 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ව්‍යවස්ථාවෙන් පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම් හතරක් ලියන්න. (ල.04)

(iii). 1978 ආණ්ඩුක්‍රම ව්‍යස්ථාවට අනුව ජනාධිපතිවරයා සතු බලතල පිළිබඳ විස්තර කරන්න. (ල.05)

(iv). 1978 ව්‍යවස්ථාවට අනුව ජනමත විචාරණය හා සමානුපාතික නියෝජන ක්‍රමය පිළිබඳ විස්තර කරන්න. (ල.06)

07. (i). නිදහසෙන් පසු වියලි කලාපයේ පිහිටවූ ගොවිජනපද ව්‍යාපාර තුනක් ලියන්න. (ලී03)

(ii). වියලි කලාපයේ ගොවිජනපද පිහිටුවීමේ අරමුණු හතරක් ලියන්න. (ල.04)

(iii). ගොවිජනපද පිහිටුවීමේදී රජය මුහුණ දුන් අභියෝග පිළිබඳ පැහැදිලි කරන්න. (ල.05)

(iv). නිදහසෙන් පසු මෙරට ක්‍රියාත්මක වූ සුභසාධන කටයුතු පිළිබඳ පැහැදිලි කරන්න. (ල.06)